# ස්ථිර නේවාසික වීසා මත ශ්‍රී ලංකාවෙන් පිටත වාසික ශ්‍රී ලාංකිකයන් (PR) සහ ද්විත්ව පුරවැසිභාවය ලබා සිටින පුද්ගලයන් හට ලබාදෙන ණය පිළිබඳ බලයලත් වෙළෙඳුන් වෙත නිකුත් කරනු ලබන විධානයන්

2017 අංක 01 දරන විදේශ විනිමය (බලයලත් වෙළෙඳුන් විසින් විදේශ ව්‍යවහාර මුදලින් සිදු කරනු ලබන ප්‍රාග්ධන ගනුදෙනු වර්ග) නියෝග සහ 2017 අංක 12 දරන විදේශ විනිමය පනතෙහි 9(2) වගන්තිය ප්‍රකාරව, වෙනත් රටක සථිර නේවාසික වීසා යටතේ ශ්‍රී ලංකාවෙන් පිටත වාසය කරන ශ්‍රී ලාංකිකයන් සහ ශ්‍රී ලංකාවේ සහ වෙනත් රටක ද්විත්ව පුරවැසිභාවය ලබාගෙන සිටින පුද්ගලයන් හට ඔවුන්ගේ නේවාසික තත්ත්වය නොසලකා පහත සඳහන් රෙගුලාසිවලට යටත්ව, තම දේශීය බැංකු ඒකක වලින් ණය ප්‍රදානය කිරීම සඳහා බලයලත් වෙළෙඳුන් වෙත අවසර දෙනු ලැබේ.

2. ණය ප්‍රදානය කිරීමේ අරමුණ

2.1 ශ්‍රී ලංකාව තුළ නේවාසික දේපළක් අත්පත් කර ගැනීම සඳහා

2.2 ශ්‍රී ලංකාව තුළ නේවාසික දේපළක් ඉදිකිරීම/සංවර්ධනය/නවීකරණය කිරීම සඳහා

3. විදේශ ව්‍යවහාර මුදලින් ප්‍රදානය කරනු ලබන ණය (විදේශ ව්‍යවහාර මුදල් ණය)

3.1 ණය ආපසු ගෙවීම සඳහා ණය ගැනුම්කරු සතුව විදේශ ව්‍යවහාර මුදල් ඉපැයීම් පවතින්නේ නම් පමණක් විදේශ ව්‍යවහාර මුදලින් ණය ප්‍රදානය කළයුතු වන අතර ණය ප්‍රදානය කිරීමට ප්‍රථමයෙන් විදේශ ව්‍යවහාර මුදලින් එම ණය ආපසු ගෙවීමට ණය ගැනුම්කරුට ඇති හැකියාව පිළිබඳව බලයලත් වෙළෙඳුන් විසින් තක්සේරු කර සෑහීමකට පත් විය යුතුය.

3.2 ණය මුදල් නිදහස් කිරීමේ හා ණය ආපසු ගෙවීම් ලබා ගැනීම සඳහා ණය ගැනුම්කරුගේ නමින් විදේශ ව්‍යවහාර ණය මුදල් ගිණුමක් විවෘත කළ යුතුය. ණය මුදල සම්පූර්ණයෙන් පියවා අවසන් වූ වහාම විදේශ ව්‍යවහාර ණය මුදල් ගිණුම වසා දැමිය යුතුය.

3.3 විදේශ ව්‍යවහාර මුදල් පිළිගැනීමට අවසර ලබාදී ඇති නේවාසික දේපළ සංවර්ධනය කරනු ලබන ශ්‍රී ලංකාවේ නේවාසික තැනැත්තන් විසින් පවත්වාගෙන යනු ලබන විදේශ විනිමය ගිණුම්වලට ණය මුදල් මාරු කරන ලෙස ණය ගැනුම්කරු ඉල්ලා සිටින්නේ නම් මිස ණය මුදල් ශ්‍රී ලංකා රුපියල්වලින් නිදහස් කළ යුතුය.

3.4 විදේශ ව්‍යවහාර මුදල් ආමුඛ ප්‍රේෂණ මගින් හෝ ණය ගැනුම්කරුගේ පුද්ගලික විදේශ ව්‍යවහාර මුදල් ගිණුම් සහ ආමුඛ ආයෝජන ගිණුම්වල පවතින අරමුදල් භාවිතා කරමින් ණය ආපසු ගෙවිය යුතුය.

4. ශ්‍රී ලංකා රුපියල්වලින් ප්‍රදානය කරනු ලබන ණය (ශ්‍රී ලංකා රුපියල් ණය)

4.1 ණය ආපසු ගෙවීමට ඇති හැකියාව තක්සේරු කර සෑහීමකට පත්වීමෙන් පසු බලයලත් වෙළෙඳුන්, ශ්‍රී ලංකා රුපියල් ණය ප්‍රදානය කළ යුතුය.

4.2 ණය මුදල් නිදහස් කිරීම හා ණය ආපසු ගෙවීම් ලබාගැනීම සඳහා ණය ගැනුම්කරුගේ නමින් ශ්‍රී ලංකා රුපියල් ණය ගිණුමක් විවෘත කළ යුතුය.

4.3 ණය මුදල් ශ්‍රී ලංකා රුපියල්වලින් පමණක් නිදහස් කළ යුතුය.

4.4 විදේශ ව්‍යවහාර මුදලින් වන ආමුඛ ප්‍රේෂණ මගින්, ණය ගැනුම්කරුගේ පුද්ගලික විදේශ ව්‍යවහාර මුදල් ගිණුම්වල සහ ආමුඛ ආයෝජන ගිණුම්වල පවතින අරමුදල් භාවිත කරමින් සහ ණය ගැනුම්කරුගේ ශ්‍රී ලංකා රුපියල් ඉපැයීම උපයෝගී කර ගනිමින් ණය ආපසු ගෙවිය යුතුය.

5. ගෙවීම් පැහැර හැරීමකදී ණය විදේශ ව්‍යවහාර මුදලින් හෝ ශ්‍රී ලංකා රුපියල්වලින් ණය අයකර ගැනීම නියෝග ප්‍රකාරව විය යුතුය.

6. අනෙකුත් කොන්දේසි

6.1 බලයලත් වෙළෙඳුන් විසින් ණය මුදල හා සම්බන්ධ සියළු අවදානම් තක්සේරු කළයුතු වන අතර, සින්නක්කර දේපළ මත උකස්කරයක් ලෙස හෝ විදේශ ව්‍යවහාර මුදල් තැන්පතු හෝ වත්කම් මත ලියමක් ඇතුළුව ණය අවදානම අඩු කර ගැනීම සඳහා ප්‍රමාණවත් අදාල විචක්ෂණශීලී පියවර ගත යුතුය.

6.2 ණය ගැණුම්කරු හට උරුමයෙන් ලද හෝ ණය ගැනුම්කරුට ශ්‍රී ලංකාවේ නේවාසිකව සිටියදී අයිති දේපලක ඉදිකිරීම/සංවර්ධනය/නවීකරණය සඳහා ණය මුදල් උපයෝගී කරගනු ලබන්නේ නම්, බලයලත් වෙළෙඳුන් විසින් ණය නිකුත් කිරීමට ප්‍රථමයෙන් 1988 අංක 30 දරන බැංකු පනත යටතේ නිකුත් කර ඇති විචක්ෂණශීලී නියෝග ප්‍රකාරව තෝරා ගනු ලැබූ තක්සේරු කරුවෙකු මගින් දේපළ සඳහා තක්සේරුවක් ලබාගත යුතුය.

6.3 6.2 ඡේදය ප්‍රකාරව ලබාගත් ණය මුදල් උපයෝගී කරගෙන අත්පත් කර ගැනීම/ඉදිකිරීම/සංවර්ධනය/නවීකරණය කරන ලද දේපලක් විකිණීමෙන් ලද මුදල් පහත පදනම මත ශ්‍රී ලංකාවෙන් පිටතට ප්‍රේෂණය කරනු ලබන බවට, බලයලත් වෙළෙඳුන් විසින් සහතික කරගත යුතුය.

(අ) ණය ආපසු ගෙවීම සඳහා ශ්‍රී ලංකාවට ප්‍රේෂණය කරනු ලැබූ මුදලට සමානුපාතික විකුණුම් මුදලක් නිදහසේ ප්‍රේෂණය කළහැක.

(ආ) ශේෂ වන යම් විකුණුම් මුදලක් වේ නම් එය සංක්‍රමණික දීමනාවට යටත්ව ප්‍රේෂණය කළ යුතුය.

6.4 අනාගත ප්‍රතිමුඛ ප්‍රේෂණ සඳහා පහසුකම් සැලසීම පිණිස ණය අයකර ගැනීම සඳහා උපයෝගී කරගත් ආමුඛ ප්‍රේෂණයන් පිළිබඳ තහවුරුවක් බලයලත් වෙළෙඳුන් විසින් නිකුත් කළ යුතුය.

6.5 ණය මුදල සම්පූර්ණයෙන් ගෙවා පියවන තෙක්, බලයලත් වෙළෙඳුන් විසින් ණය මුදල ප්‍රදානය කළ අවස්ථාවේ ලබා ගන්නා ලද ලේඛනගත සාක්ෂි, ඕනෑම ව්‍යවස්ථාපිත වාර්තා තබා ගැනීමේ අවශ්‍යතාවන් ඉක්මවා පවත්වාගෙන යා යුතුය. ණය මුදල

සම්පූර්ණයෙන් පියවූ පසු, අදාල ලේඛනගත සාක්ෂි, ව්‍යවස්ථාපිත වාර්තා තබා ගැනීමේ අවශ්‍යතාවන් පරිදි පවත්වාගෙන යා යුතුය.

6.6 බලයලත් වෙළෙඳුන් විසින් ඇමුණුම 1 පරිදි මෙම විධානයන් යටතේ ප්‍රදානය කරන ලද ණය මුදල් පිළිබඳව මාසික වාර්තාවන් එළඹෙන මාසයේ 15 වන දින හෝ ඊට පෙර dfe@cbsl.lk යන විද්‍යුත් ලිපිනය හරහා අධ්‍යක්ෂ - විදේශ විනිමය දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කිරීම අවශ්‍ය කෙරේ.

7. අවලංගු කරන ලද 1953 අංක 24 දරන විනිමය පාලන පනතේ ප්‍රතිපාදනයන් යටතේ වෙනත් රටක ස්ථිර නේවාසික වීසා මත ශ්‍රී ලංකාවෙන් පිටත වාසය කරන ශ්‍රී ලාංකිකයන් සහ ද්විත්ව පුරවැසිභාවය ලබා සිටින පුද්ගලයන් හට ප්‍රදානය කරන ලද ණය සම්බන්ධයෙන් වූ කොන්දේසි හා නියමයන් සහ එම ණය පියවා ගැනීම ද මෙම නියෝග ප්‍රකාරව බලාත්මක විය යුතුය.

අධ්‍යක්ෂ - විදේශ විනිමය දෙපාර්තමේන්තුව

2017 අංක 11 දරන විධානයන් සඳහා වූ ඇමුණුම 1

## වෙනත් රටක ස්ථිර නේවාසික වීසා යටතේ ශ්‍රී ලංකාවෙන් පිටත වාසය කරන ශ්‍රී ලාංකිකයන්ට සහ ද්විත්ව පුරවැසිභාවය ලබා සිටින පුද්ගලයන් හට, ණය ප්‍රදානය කිරීම පිළිබඳව මාසික ප්‍රකාශනය

බැංකුවේ නම : ..........................................................................................................................................

වාර්තා කරන මාසය සහ වර්ෂය : ...........................................................................

| ණය වර්ගය | ණය ගැණුම්කරුගේ නම | ණය ප්‍රදානය කරන ලද දිනය | මුදල් වර්ගය | ප්‍රදානය කරන ලද මුදල | ණය ලබාදීමේ අරමුණ |
|---|---|---|---|---|---|
| විදේශ ව්‍යවහාර මුදලින් ප්‍රදානය කරන ලද ණය (විදේශ ව්‍යවහාර මුදල් වර්ගය සඳහන් කරන්න) | | | | | |
| ශ්‍රී ලංකා රුපියල් වලින් ප්‍රදානය කරන ලද ණය | | | | | |

බැංකුවේ ගිණුම් පොත්වලින් උපුටාගත්/උත්පාදනය වූ ඉහත තොරතුරු නිවැරදි බව අපි සහතික වන්නෙමු.

බලයලත් නිලධාරියාගේ නම ...............................................................

අත්සන ...............................................................

දිනය ...............................................................

අනුකූලතා නිලධාරියාගේ නම...............................................................

අත්සන ...............................................................

දිනය ...............................................................